**ශීර්ෂය 233- ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව**

---------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ආයතනයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 21දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ආයතනය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

**(අ)** මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

**(ආ)** ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කරතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**දේපල පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය නොවන වත්කම් යටතේ ප්‍රවාහන උපකරණ වල වටිනාකම 2021.12.31 දිනට රු.18,654,796 ක් ලෙස සටහන් කර තිබුණද, දෙපාර්තමේන්තුව විසින් කොම්ප්ට්‍රෝලර් ජනරාල්ට යවාතිබූ වාහන පිළිබඳ විස්තරයට අනුව දෙපාර්තමේන්තුවට අයත් මෝටර් වාහන 24 ක වටිනාකම රු.109,406,795 ක් ලෙස සඳහන් කර තිබුණි. ඒ අනුව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි මූල්‍ය නොවන වත්කම් වල අගය සහ දෙපාර්තමේන්තුවට අයත් මූල්‍ය නොවන වත්කම්වල අගය අතර රු.90,751,999 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2021.12.31 දිනට මූල්‍ය නොවන වත්කම් යටතේ ප්‍රවාහන උපකරණ වල වටිනාකම රු. 18,654,796කි. මෙය මෝටර් වාහන 06ක වටිනාකම වේ. රු.90,752.000ක් වටිනා වාහන 20ක වටිනාකම මේ වන විට දෙපාර්තමේන්තුවේ මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම් ගත කර ඇත. වාහන 01 ක් තවමත් පවරාගෙන නොමැත. | දෙපාර්තමේන්තුවට අයත් මෝටර් වාහනවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අදාල වත්කම් ශේෂයට නිවැරදිව එකතු කිරීම කල යුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදන සලසා තිබූ සමස්ත පුනරාවර්තන වැය විෂයයන් 17 කින් පුනරාවර්තන වැය විෂයයන් 05 ක් සහ එක් මූලධන වැය විෂයයක් වෙත සලසා තිබුණු රු.14,050,000 ක ප්‍රතිපාදන වෙනත් පුනරාවර්තන වැය විෂයයන් 06 ක් සහ එක් මූලධන වැය විෂයයක් වෙත මාරු කර තිබූ | කොවිඩ් වසංගතය තත්වය නිසා සමහර වියදම් සිදු නොවීමත්, වැඩි කාලයක් දෙපාර්තමේන්තුව වසා තැබීම නිසා ප්‍රතිපාදන ඉතිරි වූ අතර කොවිඩ් තත්ත්වය නිසා සමහර වියදම් අලුතින් ඇති වීම නිසා ප්‍රතිපාදනවලින් කොටසක් | සකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය ගැන නිසි සැලකිල්ලෙන් යුක්තව පූර්වානුමාන කල හැකි සියළු සේවාවන් ඇතුලත් කර තාත්වික හා නිවැරදිව ඇස්තමේන්තු සකස් |

| | | |
|---|---|---|
| බැවින් මුදල් රෙගුලාසි 50 හි සඳහන් අවශ්‍යතා සපුරාලන පරිදි කටයුතු කරමින් තාත්ත්විකව ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණු බව විගණනයේ දී නිරීක්ෂණය විය. | මාරු කර ගැනීමට සිදු විය. | කල යුතු වේ |

**2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 94(1) ට පටහැනිව වැය විෂයයන් 04 කට අදාලව සලසා තිබූ ප්‍රතිපාදන මුදල ඉක්මවා රු.2,502,591 ක බැරකම් වලට එළඹ තිබුණි. | මුදල් රෙගුලාසි 94(2) අනුව මෙම බැදීම් වලට එළඹෙන ලදි. | මුදල් රෙගුලාසි94(1) ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ 10.1 ඡේදය යටතේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට අදාල මාර්ගෝපදේශ 3.4 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක III යටතේ වන බැදීම් හා බැරකම් ප්‍රකාශය භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් ශිර්ෂවලට අදාලව නිකුත් කරනු ලබන බැදීම් හා බැරකම් ප්‍රකාශය ( SA 92 ) සමඟ සැසඳී තිබිය යුතු වුවත් දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශන වල සඳහන් බැරකම් සහ භාණ්ඩාගාරයට වාර්තා කල බැරකම් වල එකතුව රු.11,552,941 කින් සැසඳී නොතිබුණි. | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා මු.රෙ 94(2) අනුව එළඹෙන ලද බැදීම් Cigas පරිගණක වැඩසටහනට ඇතුළත් කල නොහැකි නිසා මෙම වෙනස සිදු විය. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |

**2.3 නොසැසඳුණු පාලන ගිණුම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ACA 5 ආකෘතියෙන් ඉදිරිපත් කර තිබූ අත්තිකාරම් ගිණුමට අදාල 2021 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව අය විය යුතු හිඟ ණය ශේෂය හා දෙපාර්තමේන්තු පොත් අනුව එම ශේෂය අතර රු.20,660 ක වෙනසක් පැවතුණි. | දෙපාර්තමේන්තු පාලන ගිණුම හා කේවල ශේෂ අනුව මෙවැනි වෙනසක් දක්නට නොලැබුණද දැනට ගිණුම් සොයා ගත හැකි පැරණිම වර්ෂය වන 1996 වර්ෂයටත් පෙර සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.20,659/68ක | ණය ශේෂ අතර පවතින වෙනස්කම් සොයා බලා අවශ්‍ය නිවැරදි කිරීම් කල යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | | වෙනස හදුනා ගැනීම ප්‍රායෝගිකව සිදුකල නොහැකි බැවින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ පවතින තොරතුරු අප දෙපාර්තමේන්තුවේ තොරතුරු සමග පරීක්ෂා කිරීමෙන් අනතුරුව ශේෂ නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | |

**2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

---

| නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** | | |
| | **රු.** | | | |
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රිකසමාජවාදීජනරජයේමුදල්රෙගුලාසිසංග්‍රහය** | | | | |
| i. මුදල්රෙගුලාසි අ අ | 53,179 | සමාලෝචිත වර්ෂය තුළ සිදු වී තිබූ වාහන අනතුරු 03 ක්සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම අනතුරු 03 සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (අ) අනුව අදාල පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කර ගෙන යනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |
| **ii.** මුදල්රෙගුලාසි 135 | | නිලධාරියෙකු විශ්‍රාම යාම, ඉවත්වීම, සේවයට නොපැමිණි දින වැනි අවස්ථාවල මූල්‍ය බලතල පැවරෙන ආකාරය යාවත්කාලීන කිරීමට යොදා ඇති විධිවිධාන ඇතුලත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 135 යටතේ වාර්ෂිකව වියදම් සම්බන්ධව බලතල පවරා ලේඛනයක් පිළියෙල කරනු ලබයි. නිලධාරියෙකු විශ්‍රාම යනවිට, ඉවත්වන විට, වෙනත් විශේෂ අවස්ථාවක් සඳහා නිවාඩු ලබාගන්නා අවස්ථාවකදී එම තනතුර සඳහා වෙනත් නිලධාරියෙකු පත්කරනු ලබන හෙයින් හා රාජකාරී ආවරණය කිරීම සඳහා වැඩ බැලීමේ පදනම මත | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | | නිලධාරියෙකු පත්කරන හෙයින් එවැනි උපලේඛනයක් පවත්වාගෙන යාමට අවශ්‍ය නොවුණි. | |
| **iii.** මුදල්රෙගුලාසි අ අ | ඉන්ධන පරීක්ෂාව, මාසික සාරාංශය, මෝටර් රථ අළුත්වැඩියාව, ටයර් සහ බැටරි යෙදීම සහ හදිසි අනතුරු පිළිබඳ විස්තර ඇතුලත් කරමින් වාහන ලොග් සටහන් පොත් පවත්වා නොතිබුණි. | අදාල තොරතුරු සඳහන් කරමින් මුදල් රෙගුලාසි 1645(අ) අනුව වාහන ලොග් සටහන් පොත් පවත්වාගෙන යාම ආරම්භ කරන ලදී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |
| **(ආ)** 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | දෙපාර්තමේන්තුව සතු වාහන 16 ක ඉන්ධන දහන පරීක්ෂාව චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සිදු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව සතු සියළුම වාහන වල ඉන්ධන දහන පරීක්ෂාව 2021 වර්ෂය සඳහා සිදුකර අවසන් කර ඇත. | සෑම වාහනයක් සම්බන්ධයෙන්ම ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂණය කල යුතු වේ. |

**2.5 තත්කාර්ය අතුරු අග්‍රිමය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9 ඡේදය ප්‍රකාරව විශේෂ කාර්යයක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට ලබාදෙන අතුරු අග්‍රිම අදාල කාර්යය නිමකල විගසම පියවිය යුතු නමුත් අවස්ථා 05 කදී ලබා දී තිබූ අත්තිකාරම් පියවීමට දින 15 සිට දින 82 ක කාලයක් ගත කර තිබුණි. | පාලන අංශයේ කළමනාකරණ සහකාර නිලධාරිනියනඩත්තු විෂය භාර නිලධාරිණිය ලෙස සේවය කළ බැවින් සහ හදිසි සේවා අවශ්‍යතාවය මත ඇය වෙත මෙම අත්තිකාරම් මුදල් ලබා දී ඇත. පැවැති කොවිඩ් තත්වය හේතු කොට ගෙන භාණ්ඩ සහ කාර්මික ශ්‍රමය සපයා ගැනීමේ ප්‍රමාදයන් හේතුවෙන් මෙම අත්තිකාරම් පියවීම ප්‍රමාද වී ඇත | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව අත්තිකාරම් පියවීම කල යුතු වේ. |

**3. මෙහෙයුම්සමාලෝචනය**

**3.1 කලමනාකරණ දුර්වලතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවේ ආරක්ෂක කැමරා පද්ධතිය (CCTV) වසරකට වැඩි කාලයක සිට සේවා හා නඩත්තු කටයුතු සිදු නොකරතිබීමෙන් 2022 පෙබරවාරි 23 දින වන විට එය නිසි පරිදි ක්‍රියාත්මක නොවීය. L.P.ගැස් කාන්දු නිරාවරණ සංඥා පද්ධතියේ සේවා හා නඩත්තු සඳහා ගිවිසුම් ගතව සිටි ආයතනයේ අසතුටුදායක සේවා තත්ත්වය නිසා වසර දෙකක පමණ කාලයකට පෙර සිට එම ගිවිසුම අනුව සේවා සිදු කර නොතිබුණි. එමෙන්ම දෙපාර්තමේන්තුවේ විද්‍යාගාර වල ගැස් කාන්දු සිදු වන බවත් එම තත්ත්වය හඳුනාගැනීමේ උපකරණ ද අක්‍රියව පැවතුණි. රසායන ද්‍රව්‍ය ගබඩාව, සාමාන්‍ය ගබඩාව, විදුලි කාමරය සහ පොම්පාගාරයේ වාතාශ්‍රසලසන පද්ධතියට අදාල සේවා සහ නඩත්තු ගිවිසුම සහ CT විද්‍යාගාරයේ වායු සමීකරණ යන්ත්‍රවලට අදාල සේවා හා නඩත්තු ගිවිසුම 2021 වර්ෂයේ අගෝස්තු මාසයේ දී අවසන් වී තිබුණ ද 2022 පෙබරවාරි 23 වන විගණන දින වන විටත් සේවා හා නඩත්තු ගිවිසුම් අත්සන් කර සේවා කටයුතු සිදු කර නොතිබුණි. මේ නිසා ශ්‍රී ලංකාවේ ඇති එකම අධිකරණ විද්‍යා විද්‍යාගාරය, එහි ඇති නඩු භාණ්ඩ, විද්‍යාගාර වාර්තා සහ තහවුරු කල නඩු වලට අදාල විද්‍යාගාර වාර්තා අනාරක්ෂිත තත්ත්වයකට පත්ව තිබුණි. | අදාල නඩත්තු ගිවිසුම් අත්සන් කර නඩත්තු හා සේවා කටයුතු විධිමත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය කඩිනම් පියවර ගැනීමට කටයුතු සිදු කරමින් පවතී | යන්ත්‍රෝපකරණවල ආරක්ෂාව සඳහා ප්‍රමුඛතාවය ලබාදී කාලීනව ගිවිසුම්ගතවී නඩත්තු කටයුතු අඛණ්ඩව සිදුකිරීමට කටයුතු කලයුතුවේ |

### 3.3 අපේක්ෂිත නිමැවුම් මට්ටම් ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවේ විවිධ අංශයන්ගෙන් නඩු කටයුතු සඳහා විශේෂඥ වාර්තා ලබා ගැනීමේ අරමුණින් කැඳවා තිබූ වාර්තා වලින් 14,673 ක් 2020 දෙසැම්බර් 31 දිනට ලබා දීමට නොහැකිව තිබූ අතර සමාලෝචිත වර්ෂය තුල දී වාර්තා 29,273 ක් අධිකරණයට කැඳවා තිබුණි. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය තුල දී අධිකරණය වෙත වාර්තා 36,328 ක් ලබා දී තිබුණු අතර වාර්තා 7,618 ක් හෙවත්සියයට 17 ක් ලබා දීමට නොහැකි වී තිබුණි. | 2021 වර්ෂය ආරම්භයේ දී එතෙක් ගොඩගැසී තිබුණු වාර්තා නොකල නඩු ප්‍රමාණයෙන් අඩකටත් වඩාවැඩි ප්‍රමාණයක් වර්ෂය තුලදී වාර්තා නිකුත් කර ඇති අතර, වාර්තා නොකල නඩු ප්‍රමාණය සාපේක්ෂව ඉතා පහල මට්ටමක් දක්වා අඩු කර ගෙන ඇත | වාර්ෂික නඩු වැඩිවීමේ ප්‍රවණතාවයට සාපේක්ෂව වාර්තා නිකුත් කිරීමේ ක්‍රමවේදයක් හඳුනාගෙන ක්‍රියාත්මක කල යුතු වේ. |

### 3.4 ප්‍රසම්පාදනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 හි 4 (2)(2) ප්‍රකාරව සකස් කල යුතු ප්‍රසම්පාදන කටයුතු ආරම්භ වීමේ අවස්ථාවේ සිට අවසන් කරනතුරු එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන් හි විස්තර දැක්වෙන පරිදි විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | 2022 වර්ෂයේ සිට රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම විස්තරාත්මකව ඉදිරිපත්කිරීමට කටයුතු කරනු ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම පිලියෙලකර ක්‍රියාත්මක කල යුතුවේ. |

**3.5 රජයේ නිලධාරීන්ගේ ඇප තැබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැතිඅංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අනුව මුදල් රෙගුලාසි 315 (1) සහ 880 ප්‍රකාරව රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද ඇප ලේඛණයක් ද පවත්වාගෙන ගොස් නොතිබුණි. | මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව ඇප තැබීමට සහ ඇප ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු ආරම්භ කරන ලදී. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුවේ. |

**4. අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ 2021 වර්ෂය වෙනුවෙන් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණක තනතුර සඳහා 2021.11.19 දින සිට ක්‍රියාත්මක වන පරිදි අධිකරණ අමාත්‍යාංශයේ ගණකාධිකාරිනියක් වැඩ බැලීමේ පදනම මත පත් කර ඇත. | විගණන පනත ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවිය යුතුවේ. |
| (ආ) 2021 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි | අභ්‍යන්තර විගණකවරයෙකු අනුයුක්ත කර නොතිබීම හේතුවෙන් අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කර නොමැත. 2022 වර්ෂය සඳහා අදාල අභ්‍යන්තර විගණන සැලැස්ම මේ වන විට පිළියෙල කර ඇත. | අභ්‍යන්තර විගණනය වෙනුවෙන් අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කල යුතුවේ. |

## 5. මානව සම්පත් කලමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා අනුමත කාර්ය මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ හා තෘතීයික මට්ටමේ පුරප්පාඩු 32 ක් වූ අතර එය අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 24 ක ප්‍රතිශතයක් විය. එකී පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබීම දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනයට සෘජුවම බලපා තිබුණි. | ආණ්ඩුවේ රස පරීක්ෂක තනතුර සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත පූර්ණ කාලීනව වැඩ බැලීමට නිලධාරිනියක පත්කර ඇත අතිරේක රස පරීක්ෂක තනතුරු නිත්‍ය පරීක්ෂක තනතුරු ක් හා සැකකටයුතු පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂක තනතුරු වැඩබැලීමේ පදනමින්ද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි මේවනවිට සම්පූර්ණකර ඇත රියදුරු සහ සංවර්ධන නිලධාරී තනතුරු පුරප්පාඩු සම්පූර්ණකර ඇත කළමනාකරණ සේවා නිලධාරී පුරප්පාඩු පිළිබඳව රාජ්‍ය පළාත්සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත | ආයතනයේ අරමුණු හා ප්‍රධාන කාර්යයන් ඵලදායීව ඉටු කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරුවලට අදාල කාර්ය මණ්ඩලය බඳවා ගැනීම ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකා කටයුතු කල යුතු වේ. |
| (ආ) රාජ්‍ය අංශය තුළ මානව සම්පත් සංවර්ධනය කිරීම මැයෙන් වූ 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඇමුණුම් 01, 02 හා චක්‍රලේඛයේ 6.1 හා 6.5 ඡේද ප්‍රකාරව ඉටු කළයුතු අවශ්‍යතාවයන්, සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි. | අවශ්‍ය කටයුතු සම්පූර්ණ කිරීමට කටයුතු කරමින් පවතී. | චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධනය කිරීමට අවශ්‍ය සැලැස්ම පිළියෙල කල යුතුවේ. |

| | | |
|---|---|---|
| (ඇ)ශ්‍රී ලංකාවේ අධිකරණ වල පැවැත්වෙන නඩු කටයුතු සඳහා දෛනිකව ලබා දිය යුතු විද්‍යාගාර වාර්තා ලබා දීමට නොහැකිව, ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන්ගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සියයට 36 ක් 2019 දෙසැම්බර් 31 දිනට තිබිය දී සහ විද්‍යාත්මක සේවයේ නිලධාරීන් මෙන්ම සියළුම නිලධාරීන් සාමාන්‍ය රාජකාරි කාලයට අතිරේත කාලයක් සඳහා විශේෂ දීමනා ගෙවමින් සේවයේ යොදවන වතාවරණයන් තුල නිලධාරීන් රාජකාරි ආවරණය කිරීම සඳහා වැඩ පිළිවෙලක් යොදා ඇති බව සහතික කරමින් නිලධාරීන් දෙදෙනකු (02) සඳහා වැටුප් රහිත වසර 03 ක සහ වසර 05 ක විදේශ රැකියා සඳහා2016.12.01 සහ 2017.01.30 දින වලදී නිවාඩු නිර්දේශ කර තිබුණි. එම නිලධාරීන් විගණන දිනය වූ 2022 මාර්තු 23 වන විටත් ආපසු සේවයට වාර්තා කර නොතිබූ අතර රජයට අයවිය යුතු රු.1,724,506 ක මුදල අයකර ගැනීමට ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් අයකර ගැනීමට කටයුතු කර ගෙන යනු ලැබේ. | ප්‍රමාදයකින් තොරව රජයට අයවිය යුතු මුදල් අයකර ගත යුතු වේ. |
| (ඈ)දෙපාර්තමේන්තුවේ එක් නිලධාරිනියක් පශ්චාත් උපාධි පාඨමාලාවක් සඳහා 2019.09.16 දිනසිට විදේශ නිවාඩු ලබා ගෙන විගණිත දිනය වූ 2022 මාර්තු 23 වන විටත් ආපසු නොපැමිණීම නිසා, රජයෙන් ගෙවාතිබූ මුදල් සහ නිලධාරිනියට ගෙවූ වැටුප්වල එකතුව රු.9,270,726 ක් සහ ලැප්ටොප් පරිගණකයක් ඇතුළු රජයේ දේපල වලින් රජයට අලාභයක් කර තිබිය දී ආයතන සංග්‍රහයේ XV පරිච්ඡේදයේ 4.12 වගන්තිය ප්‍රකාරව අත්සන් කර තිබූ ඇප බැඳුම්කරය අනුව අදාල ඇපකරුවන්ගෙන් හෝ එම මුදල් අයකර ගැනීමට වසරක කාලයක් ගත වී තිබුණ ද ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරමින් සිටි. | රජයට අයවිය යුතු මුදල් ඇපකරුවන්ගෙන් ප්‍රමාදයකින් තොරව අයකර ගතයුතුවේ. |